රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 19/2016(I)

මගේ අංකය: EST-3/POLIC/04/0051
රාජ්‍ය පරිපාලන හා
කළමනාකරණ අමාත්‍යාංශය
නිදහස් චතුරස්‍රය
කොළඹ 07.

2017.04.25

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

**<u>මැතිවරණ සඳහා ඉදිරිපත්වීමට රජයේ සේවයෙන් ඉල්ලා අස්වූ දේශපාලන අයිතිවාසිකම් අහිමි නිලධරයන් නැවත සේවයේ පිහිටුවීම</u>**

ආයතන සංග්‍රහයේ XXXII වැනි පරිච්ඡේදයේ 1:3 උප වගන්තියට 1:3:1 උපවගන්තිය ඇතුළත් කරමින් නිකුත් කරන ලද 2016.08.08 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 19/2016 කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමි.

02. එම චක්‍රලේඛය පහත විධිවිධානවලට යටත්ව අවලංගු කිරීමට 2017.03.21 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී තීරණය කර ඇත.

I. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 19/2016 ප්‍රකාරව, 2017.03.21 දින තෙක් ගෙන ඇති මොනයම් හෝ ක්‍රියාමාර්ගයකට අගතියක් නොවන අයුරින්, එදින සිට ක්‍රියාත්මක වන පරිදි එකී චක්‍රලේඛය අවලංගු කිරීම.

II. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 19/2016හි විධිවිධාන පරිදි නැවත සේවයේ පිහිටුවන ලද රාජ්‍ය සේවකයින්ගේ වැටුප්, ආයතන සංග්‍රහයේ VII වැනි පරිච්ඡේදයේ 6:5 උප වගන්තියෙහි විධිවිධාන අනුව තීරණය කිරීම.

ජේ.ජේ.රත්නසිරි
ලේකම්
රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය